# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024.07.10


පැමිණිලිකාරිය : ඩී.ඩී.සී. මලව්පතිරණ මිය.
140/11. අවිස්සාවේල්ල පාර.
මහබුත්ගමුව.
මුල්ලේරියාව නව නගරය.

වගඋත්තර පාර්ශවය : 01 විදුහල්පති.
රාජකීය විද්‍යාලය.
කොළඹ 07.

02 අධ්‍යක්ෂ (ජාතික පාසල්).
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

**පැමිණිලි අංකය : HRC/128/19**

**පැමිණිල්ල**

පැමිණිලිකාරිය වන ඩී. ඩී. සී. මලව්පතිරණ යන අය විසින් ඉහත පැමිණිලි අංකය යටතේ 2019.01.09 දාතමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2019 වසරේ කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණිය සඳහා සිරිවර්ධනගේ දෙහාත් මන්දිල් සිරිවර්ධන වන තම දරුවා ඇතුලත් කර ගැනීම සඳහා "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය" යටතේ අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ බවත්, එහිදී පදිංචි ස්ථානය පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පැමිණීමට අපේක්ෂා කරන බව විදුහල්පති විසින් තමන් වෙත ප්‍රකාශ කරන ලද බවත් ය. ඒ වනවිට තමා පදිංචි නිවස අයත් භූමිය ඔරුගොඩවත්ත සිට අඹතලේ මාර්ගය පුළුල් කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගෙන තිබූ බැවින් පදිංචිව සිටි පැරණි නිවස කඩා ඉවත් කර ඉතිරි වූ ඉඩම් කොටසේ නව නිවසක් ඉදි කරමින් පැවති බවත්, පවරා ගත් තම දේපල වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා දුන්


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail } sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

කුලී දීමනාවෙන් තාවකාලික කුලී නිවසක ඒ වනවිට පදිංචිව සිටි බවත්, මෙම තත්වය මත විදුහල්පතිවරයා විසින් සම්මුඛ පරීක්ෂණයේදී තම අයදුම් පත්‍රය සම්බන්ධයෙන් ලකුණු ලබාදීමක් සිදු නොකල බවත් සඳහන් කර ඇත. ඒ අනුව අභියාචනා විරෝධතා මණ්ඩලය වෙත විධිමත් අභියාචනයක් ඉදිරිපත් කිරීමට කටයුතු කල බවත් දක්වා ඇත. එසේම, එකී අභියාචනය සඳහා 2018.12.16 වන දින විද්‍යාලයෙන් කැඳවීමක් ලැබුණු බවත්, එහිදී තමන් ඉදිරිපත් කරන ලද ලේඛන වල අඩුපාඩු පෙන්වාදුන් බවත්. නැවත 2018.12.18 දින කැඳවා තම ලේඛන පරීක්ෂා කර ලකුණු 58.05 ක ප්‍රමාණයක් ලබා දුන් බවත් දක්වා ඇත.

තවද, 2018.12.31 දින අභියාචන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නියෝජිතයින් තම නිවස පරීක්ෂා කිරීමට පැමිණි අතර, ඉටිකොල වලින් සකස් කරගෙන හෝ අයදුම්කරුවන් නිවසේ පදිංචිව සිටීම අනිවාර්ය බව ඔවුන් එහිදී පවසා සිටි බවත් දක්වා ඇත. එහිදී තමාගේ දරුවන් දෙදෙනා කුඩා දරුවන් බැවින් ඉදි කරමින් පවතින නිවසක පදිංචිව සිටීමේ අපහසුතාවය හා පදිංචියට පැමිණීමට හැකි ආකාරයෙන් අදාල ඉදිකිරීම් කටයුතු සිදු කර ගැනීමෙන් අනතුරුව පදිංචියට පැමිණෙන බවට ඔවුන් හා ප්‍රකාශ කල බවත් සඳහන් කර ඇත. කෙසේ වෙතත් 2019.01.06 වන දින පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රසිද්ධ කර තිබූ පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඉදිරිපත් වූ දරුවන් ඇතුලත් කර ගැනීමේ නාම ලේඛනයේ මුළු ලකුණු 57 ලබා ගත් ළමුන්ගේ නම් සඳහන්ව තිබූ නමුත් මුළු ලකුණු 58.05 ක් ලබා ගෙන තිබූ තම දරුවාගේ නම ස්ථිර ලේඛනයේ සඳහන් නොවීම මගින් තම අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්, එබැවින් මේ සම්බන්ධව විමර්ශනයක් සිදු කර තම දරුවා 2019 වසරේ කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා ඇත.

**1 වන වගඋත්තරකාර පාර්ශවය වන කොළඹ රාජකීය විද්‍යාලය**

මෙම පැමිණිල්ලට අදාලව මානව හිමිකම් කොමිෂන් සභාවේ දැන්වීම පරිදි කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ සඳහා කොළඹ රාජකීය විද්‍යාලය නියෝජනය කරමින් සහභාගී වී ඇති නියෝජිතයින් ප්‍රකාශ කර ඇත්තේ, අයදුම්කරුවන්ගේ පදිංචිය සම්බන්ධ ගැටළු සහගත තත්වයක් නිරීක්ෂණය වී තිබීම මත පැමිණිලි පාර්ශවය සඳහන් කර ඇති පරිදි පැවති සම්මුඛ පරීක්ෂණයේදී අයදුම් පත්‍රය සඳහා ලකුණු ලබාදීමක් සිදු කර නොමැති බවයි. කෙසේ වෙතත් අභියාචනා විරෝධතා මණ්ඩලය වෙත පැමිණිලි පාර්ශවය අභියාචනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මුළු ලකුණු 58.05 ක ප්‍රමාණයක් ලබාදීමට කටයුතු කර ඇති බවත්. 24/2018 චක්‍රලේඛයේ 9.3.3 වගන්තිය පරිදි තාවකාලික සහ පොරොත්තු ලේඛන ප්‍රසිද්ධ කිරීමට පෙර ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඉහල ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ගේ පදිංචි ස්ථාන පරීක්ෂා කිරීම මගින් පදිංචිය සනාථ කරගත යුතු බැවින් 2018.12.31 දින අයදුම්කාරියගේ නිවසට ගොස් සිදුකල පරීක්ෂාවේදී අයදුම්කාරිය, කලත්‍රයා

හෝ දරුවන් එම නිවසේ නොසිටි බවත්, එම ස්ථානයේ ඒ වනවිට නව නිවසක් ඉදිකරමින් පැවති බවත්, ඒ අනුව තාවකාලික හා පොරොත්තු ලේඛන වලින් පැමිණිලිකාරියගේ දරුවාගේ නම ඉවත් කිරීමට කටයුතු කර ඇති බවත් සඳහන් කර ඇත. ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මෙහිදී 24/2018 චක්‍රලේඛයට අනුකූලව කටයුතු කර ඇති බැවින් පැමිණිලි පාර්ශවයේ අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් කටයුතු කර නොමැති බව ප්‍රකාශ කර ඇත.

<u>2 වන වගඋත්තරකාර පාර්ශවය වන අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) අධ්‍යාපන අමාත්‍යාංශය</u>

මෙම පැමිණිල්ලට අදාලව අංක ED/1/6/12/HRC/2019-9 සහ 2022.12.26 දිනැති වාර්තාව ඉදිරිපත් කරමින් අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) අධ්‍යාපන අමාත්‍යාංශය සඳහන් කර ඇත්තේ, 2019 වර්ෂයේ කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට දරුවා ඇතුලත් කිරීම සඳහා පැමිණිලිකාරිය විසින් අයදුම්පත යොමු කර ඇති බවත්, ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම යටතේ මෙම පැමිණිලිකාරියගේ නිවසෙහි කොටසක් ද කඩා ඉවත් කර ඇති බවත්ය. තවද, ඉතිරි වූ කොටසේ පදිංචි වීමට නොහැකි බැවින් නිවස සම්පූර්ණයෙන්ම කඩා ඉවත් කර එම ස්ථානයේ නව නිවසක් ඉදි කරන බව පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති ඡායාරූප මගින් සනාථ වන බවත්, එම ඡායාරූප අනුව, අදාල නිවසේ ඒ වන විට පදිංචි වී සිටීමේ හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වන බවත් දක්වා ඇත.

<u>නිරීක්ෂණ</u>

මෙම පැමිණිල්ලට අදාලව පවත්වා ඇති වැඩිදුර විමර්ශනයේදී පැමිණිලි පාර්ශවය වගඋත්තරකරුවන් සහ සාක්ෂිකාර පාර්ශවයක් ලෙස කැඳවා ඇති මාර්ග සංවර්ධන අධිකාරිය යන පාර්ශවයන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් අනුව සලකා බැලීමේදී,

1. පැමිණිලිකාරිය තම පුත්‍රයා වන සිරිවර්ධනගේ දෙහාන් මන්දිල් සිරිවර්ධන දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ 2019 වසරේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා 140/11, අවිස්සාවේල්ල පාර, මහබුත්ගමුව, මුල්ලේරියාව නව නගරය යන ලිපිනයේ පදිංචිව සිට “පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය” යටතේ අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

2. එම අයදුම් පත්‍රය සලකා බැලීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේදී විදුහල්පතිවරයා විසින් පැමිණිලිකාරියගේ නිවසේ පදිංචිය පරීක්ෂා කිරීමට පැමිණෙන බව පැවසූ අවස්ථාවේදී, පැමිණිලිකාරිය විසින් තමා පදිංචි නිවස අයත් භූමියෙන් කොටසක්

ඔරුගොඩවත්ත, අඹතලේ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා රජයේ අවශ්‍යතාවය මත මාර්ග සංවර්ධන අධිකාරිය මගින් අත්පත් කරගෙන ඇති බවත්, ඒ අනුව අදාල නිවස කඩා ඉවත් කර ඉතිරි වූ ඉඩම් කොටසේ නව නිවසක් ඉදි කරමින් පවතින බවත්, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගෙවූ කුලී දීමනාවෙන් තාවකාලිකව කුලියට ගත් නිවසක දැනට ජීවත් වන බවත් පවසා ඇත. එසේම, සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කරන ලද ලේඛන සලකා බැලීමෙන් අනතුරුව විදුහල්පතිවරයා විසින් ලකුණු ලබාදීමක් සිදු කර නොමැති බව සහ අභියාචනයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බව අනාවරණය වේ.

3. ඒ අනුව අදාල වසමේ ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් ලිපිය, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබාදී ඇති ලිපි ලේඛන සහ තාවකාලිකව පදිංචිව සිටි කුලී නිවසට අදාල බදු ගිවිසුම යන ලේඛන ඇතුලත්ව පැමිණිලිකාරිය විසින් අභියාචනා විරෝධතා මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව අනාවරණය වේ.

4. 2018.12.18 වන දින අදාල අභියාචනය සලකා බැලීමට කටයුතු කර ඇති අභියාචනා විරෝධතා මණ්ඩලය විසින් අයදුම්කාර පාර්ශවය ඉදිරිපත් කර ඇති ලිපි ලේඛන සලකා බැලීමෙන් අනතුරුව මුළු ලකුණු 58.05ක ප්‍රමාණයක් ලබාදී ඇති බවත්, 2019 වසරේ පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට දරුවන් ඇතුලත් කර ගැනීමට අදාල කඩඉම් ලකුණ වී ඇත්තේ ලකුණු 57 බවත්, පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති ලේඛන, 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කොළඹ රාජකීය විද්‍යාලය විසින් ඉදිරිපත් කර ඇති 2022.12.13 දිනැති වාර්තාව සහ කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ වලදී ඉදිරිපත්ව ඇති කරුණු අනුව තිරීක්ෂණය වේ.

5. අභියාචනා විරෝධතා පරීක්ෂාවෙන් පසුව 2018.12.31 වන දින අභියාචනා විරෝධතා මණ්ඩල නිලධාරීන් පැමිණිලිකාරිය පදිංචි නිවස නැතහොත් පදිංචි ස්ථානය පරීක්ෂාවට ගොස් ඇති බවත්, එම අවස්ථාවේදී පවුලේ සාමාජිකයින් එහි පදිංචිව නොසිටි බව සඳහන් කරමින් 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කොළඹ රාජකීය විද්‍යාලය විසින් තාවකාලික හා පොරොත්තු ලේඛනයෙන් පැමිණිලිකාරියගේ දරුවාගේ නම ඉවත් කර ඇති බවත් 2019.05.07 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී ඉදිරිපත්ව ඇති කරුණු සහ 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කොළඹ රාජකීය විද්‍යාලය විසින් යොමු කර ඇති 2022.12.13 දිනැති වාර්තාව ප්‍රකාරව තිරීක්ෂණය වේ.

6. කෙසේ වෙතත් එම අවස්ථාවේ නිවසේ රැඳී සිටි අය විසින් පැමිණිලිකාරිය වෙත දැන්වීමෙන් පසුව එම ස්ථානයට ඔවුන් පැමිණ අභියාචනා විරෝධතා මණ්ඩල සාමාජිකයින් හමුවී සාකච්ඡා කර ඇති බවත්, එහිදී අදාල නිවසේ ඉටිකොළ යොදා හෝ පැමිණිලිකාරිය පදිංචිව සිටිය යුතු බවට ස්ථානය පරීක්ෂාවට පැමිණි අභියාචනා විරෝධතා මණ්ඩල නිලධාරීන් විසින් ප්‍රකාශ කළ බවත්, 2019.05.07 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී ඉදිරිපත්ව ඇති කරුණු අනුව අනාවරණය වී ඇත.

7. තවද, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අංක RDA/LARD/2008/Oru-Amb/9353/41 සහ 2018.12.17 දිනැතිව කොළඹ රාජකීය විද්‍යාලය වෙත නිකුත් කර ඇති ලිපිය සහ 2022.11.25 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් විසින් සිදු කර ඇති කරුණු දැක්වීම් සලකා බැලීමේදී පැමිණිලිකාරිය පදිංචි නිවස අයත් භූමියෙන් කොටසක් ඔරුගොඩවත්ත, අඹතලේ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා රජයේ අවශ්‍යතාවය මත මූලික පිඹුරු අංක **9353** හි කැබලි අංක 41 යටතේ 2018.04.04 වන දින මාර්ග සංවර්ධන අධිකාරිය මගින් අත්පත් කරගෙන ඇති බවත්, එකී භූමියෙහි පිහිටි නිවසෙහි කොටසක් කඩා ඉවත් කිරීමට සිදුවීම හේතුවෙන් තාවකාලික පදිංචිය සඳහා ගෙවල් කුලී දීමනාවක් ලෙස රු.75,000.00ක මුදලක් පැමිණිලිකාරිය හට ලබා දී ඇති බවත් අනාවරණය වේ. ඒ අනුව පැමිණිලිකාරිය පදිංචි නිවස අයත් භූමියෙන් කොටසක් ඔරුගොඩවත්ත, අඹතලේ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා රජයේ අවශ්‍යතාවය මත මාර්ග සංවර්ධන අධිකාරිය මගින් අත්පත් කරගත් බවටත්, ඒ අනුව නිවස කඩා ඉවත් කිරීමට සිදු වූ බවටත් පැමිණිලිකාරිය විසින් සිදු කර ඇති ප්‍රකාශය තහවුරු වන බව නිරීක්ෂණය වේ.

8. එසේම, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අංක RDA/LARD/9353/41 සහ 2018.04.04 දිනැතිව පැමිණිලිකාරිය වෙත යොමු කර ඇති ලිපිය පරීක්ෂා කර බැලීමේදී අදාල ඉඩම අත්පත් කරගැනීමෙන් අනතුරුව 2018.04.04 වන දින ඊට අදාල වන්දි මුදල් ලබාදී එතැන් සිට මාසයක් ඇතුළත හෝ ඊට පෙර එකී ඉඩම තුළ පිහිටි නිර්මිතයන් කඩා ඉවත් කර භාරදීමට කටයුතු කරන ලෙසට සිදු කළ දැනුම්දීම මත නිවස කඩා ඉවත් කර ඉඩම භාරදීමට කටයුතු කළ බවට පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇති කරුණු තහවුරු වන බව නිරීක්ෂණය වේ.

9. තවද, අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද අංක ED/1/6/12/HRC/2019-9 සහ 2022.12.26 දිනැති වාර්තාව ප්‍රකාරව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගැනීමෙන් අනතුරුව

ඉතිරි වූ නිවාස කොටසේ ඒ වන විට පදිංචි වී සිටීමේ හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වූ බවට සඳහන් කර ඇති බැවින් එලෙස අත්පත් කරගැනීමෙන් අනතුරුව ඉතිරි වූ කොටසේ පදිංචිව සිටීමට ඉඩකඩ නොමැතිවූ බවට පැමිණිලිකාරිය විසින් දක්වා ඇති කරුණු තහවුරු වන බව නිරීක්ෂණය වේ.

10. එසේම, ප්‍රසිද්ධ නොතාරිස් එම්.ජී. ජයන්ත මහතා විසින් 2018.04.22 වන දින ලියා සහතික කරන ලද බදු ගිවිසුම ප්‍රකාරව පැමිණිලිකාරියගේ ස්වාමි පුරුෂයා විසින් 2018.04.19 වන දින සිට මාස හයක කාලයක් සඳහා නො.158/3/ජී. අයි.ඩී.එච්. පාර, කොටිකාවත්ත යන ලිපිනයෙහි පිහිටි නිවසෙහි උඩු මහල බදු පදනමින් ලබාගෙන ඇති බව අනාවරණය වේ. ඒ අනුව අදාළ ඉඩමෙහි කොටසක් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් අත්පත් කරගැනීමෙන් අනතුරුව ඉතිරි වූ නිවාස කොටසේ පදිංචිව සිටීමට ඉඩකඩ නොමැතිවීම හේතුවෙන් එම ඉඩමෙහි නව නිවසක් ගොඩනගාගන්නා තුරු තාවකාලිකව කුලී නිවසක පදිංචි වූ බවට පැමිණිලිකාරිය විසින් දක්වන ලද කරුණු තහවුරු වන බව නිරීක්ෂණය වේ.

**නිගමනය**

මෙම පැමිණිල්ල සම්බන්ධව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු සැලකිල්ලට ගැනීමේදී පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ 2019 වසරේ කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට සිය දරුවා ඇතුලත් කර ගැනීම සඳහා පැමිණිලිකාරිය විසින් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර ඇති බවත්, එම ගණය යටතේ වන කඩඉම් ලකුණ වන ලකුණු 57 ඉක්මවා ලකුණු 58.05ක් ලබා ගෙන සිය දරුවා ඇතුලත් කර ගැනීමට පැමිණිලිකාරිය සුදුසුකම් ලබා ඇති බවත් අනාවරණය වේ.

එවැනි පසුබිමක් තුළ පැමිණිලිකාරියගේ පාලනයෙන් තොර හුදෙක් රජයේ අවශ්‍යතාවයක් මත පැමිණිලිකාරියගේ ඉඩමෙහි කොටසක් අත්පත් කරගැනීම හේතුවෙන් පැමිණිලිකාරිය සහ ඇයගේ පවුලේ සාමාජිකයන් තාවකාලිකව ඉන් ඉවත්ව සිටීම පාදක කරගනිමින් 1 වන වගඋත්තරකාර පාර්ශවය වන කොළඹ රාජකීය විද්‍යාලය විසින් පැමිණිලිකාරියගේ දරුවා 2019 වසරේ කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර නොගැනීම මගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

## <u>නිර්දේශය</u>

ඉහත නිගමනය පරිදි පැමිණිලිකාරියගේ පුත්‍රයා කොළඹ රාජකීය විද්‍යාලයේ, මේ වන විට ඇතුළත් වීමට නියමිත ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට කටයුතු කරන ලෙස ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය සහ විදුහල්පති, රාජකීය විද්‍යාලය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2024.08.14 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 (7)වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්. ටී. බී. දෙහිදෙණිය
සභාපති,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත =: 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්, - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.